## නැගෙනහිර පළාතේ ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය (ග්‍රාමීය ජල සංරචකය)- 2015

-------------------------------------------------------------------------------------------------------

නැගෙනහිර පළාතේ ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතියේ (ග්‍රාමීය ජල සංරචකය) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්-පී 98 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4.08(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වර්තමානයේ ජාතික සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නැගෙනහිර පළාත් සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. නැගෙනහිර පළාතේ ජල සම්පාදන පහසුකම් ඉදිකිරීම හා ව්‍යාප්ත කිරීම මගින් ආරක්ෂිත පානීය ජලය සැපයීම සහ එමගින් ප්‍රදේශයේ ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීමට සහ දිළිඳුකම අඩු කිරීම සඳහා දායකවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපන් යෙන් මිලියන 6,054 ක් වන අතර ඉන් ජපන් යෙන් මිලියන 4,904 ක් මූල්‍යායනය කිරීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. තවද රු.මිලියන 1,176 කට සමාන ජපන් යෙන් මිලියන 924 ක් ව්‍යාපෘතියේ ග්‍රාමීය ජල සංරචකය සඳහා වෙන්කර තිබූ අතර මෙම කාර්යය සඳහා රු.මිලියන 972 කට සමාන ජපන් යෙන් මිලියන 764 ක් මූල්‍යායනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මාර්තු 26 දින ආරම්භ කරන ලද අතර 2013 දෙසැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2015 ජූලි 23 දක්වා දීර්ඝ කරන ලදි. කෙසේ වුවද 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය

ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උපදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් - සමාලෝචිත වර්ෂය තුළ | උපයෝජනය කළ අරමුදල් - 2015 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 764 | 972 | - | - | 857 | 1,180 |
| ශ්‍රීලංර | 160 | 204 | 10.94 | 10.94 | 177 | 242 |
| එකතුව | 924 | 1,176 | 10.94 | 10.94 | 1,034 | 1,422 |

### 3.2 භෞතික කාර්ය සාධනය

ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාව අනුව, ත්‍රිකුණාමලය, අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කවල ග්‍රාමීය ජල සැපයුම් යෝජනා ක්‍රම 24 ක් යටතේ ව්‍යාපෘති කාර්යයන් 2015 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි.

**3.3** **කොන්ත්‍රාත් පරිපාලනය**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 152.93 ක පිරිවැයකට පුල්මොඩෙයි ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ සිවිල් වැඩ හා ජල නල සැපයීම හා එළීම සඳහා 2012 වර්ෂයේදී පිරිනමන ලද කොන්ත්‍රාත්තුව නිම කර 2015 පෙබරවාරි 02 දින ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලයට භාරදී තිබුණි. පෙර වර්ෂය සඳහා නිකුත් කරන ලද මාගේ වාර්තාවේ පුල්මොඩෙයි ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳව පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කර ගැනීමට 2015 දෙසැම්බර් 31 වන විටත් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(i) රු.914,375 ක පිරිවැයකට පුල්මොඩෙයි - කෝකිලායි මාර්ගයේ මීටර 1100 ක් දිගට එළන ලද පීවීසී ජල නල හානිවීම් පිළිසකර කිරීම.

(ii) ජලයේ අඩු ගුණාත්මක තත්ත්වය හේතුවෙන්, භාවිතයෙන් තොරව පැවතුණු ජල පිරිපහදු පද්ධතියට ජලය පොම්ප කිරීමේ කාර්යය සඳහා යාන් ඔයෙහි ඉදිකරන ලද ජල තුළු මග (intake) ළිං 03 කින් තුළු මග ළිං දෙකක් භාවිතය සඳහා විකල්ප ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විධිමත් ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීමෙන් තොරව අදාළ ළිං ඉදිකිරීම හේතුවෙන් ඒ සඳහා වැය කරන ලද රු.මිලියන 2.10 ක මුදලක් ඵලරහිත වී තිබුණි. තවද 2016 ජුනි මාසයේදී විගණකවරුන් විසින් කරන ලද ස්ථානීය භෞතික පරීක්ෂණ වලට අනුව, අදාළ තුළු මග ළිං වල මෙහෙයුම් අසාර්ථකවීම හේතුවෙන් තුළු මග ළිං ඉදිකිරීම මඟින් පුල්මොඩෙයි ප්‍රදේශයේ 3500 ක් වූ නිවාසවලට ජලය සැපයීම දිනකට පැය 02 කට සීමා වී තිබූ බව අනාවරණය විය.

(ආ) මාගේ පෙර විගණන වාර්තාවේ සඳහන් කළ පරිදි, පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජීවත්වන ජනතාව සඳහා වකුගඩු රෝග වලින් විශාල බලපෑමක් ඇතිවී තිබියදීත්, රු.මිලියන 149.45 ක පිරිවැයකට ක්‍රියාත්මක කරන ලද පදවි ශ්‍රී පුර ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ පිරිසිදු කරන ලද ජලය සැපයීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබුණි. හැරු ළිං වලින් පවිත්‍ර නොකළ ජලය නිවාස වලට සෘජුවම සපයන බවත්, පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව මඟින් සපයන ලද පානීය ජලය මිලදී ගැනීමට අමතර පිරිවැයක් අඛණ්ඩව දැරීමට ප්‍රදේශයේ ජනතාවට සිදුවී ඇති බවත් ස්ථානීය පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

(ඇ) මඩකලපුව දිස්ත්‍රික්කයේ කුලවිනමඩු, තන්තමලෙයි උප ව්‍යාපෘති යටතේ රු.මිලියන 27 ක පිරිවැයකට 2012 වර්ෂයේදී පිරිනමන ලද සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් 2013 වර්ෂයේදී අවසන් කර තිබුණි. පසුව කොන්ත්‍රාත්තුව රු.මිලියන 10.95 ක පිරිවැයකට වෙනත් කොන්ත්‍රාත්කරුවකුට නැවත පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර කොන්ත්‍රාත්කරුගේ හැකියාව හා පෙර පළපුරුද්ද පිළිබඳ පරීක්ෂා කර නොතිබූ බව නිරීක්ෂණය විය. තවද ඇප බැඳුම්කරය එහි වලංගු කාල පරිච්ඡේදය තුළ මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එබැවින් කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු.586,141 ක වැඩ පූර්ව අත්තිකාරම් 2015 දෙසැම්බර් 31 වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(iii) තවද, කොන්ත්‍රාත්තුව අවසන් කරන අවස්ථාවේදී වැඩ බිමේ පැවති රු.977,509 ක් වටිනා ද්‍රව්‍ය ව්‍යාපෘතියට භාරදී නොතිබුණු බවත් කොන්ත්‍රාත් ගිවිසුමේ මේ සම්බන්ධයෙන් විධිවිධාන නොමැතිවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට ව්‍යාපෘතියට නොහැකිවී තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ඈ) මඩකලපුව දිස්ත්‍රික්කයේ කරදියනාරු හි ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ රු.මිලියන 20.91 ක මුළු පිරිවැයකට ව්‍යාපෘතිය විසින් ඉදිකරන ලද නොගැඹුරු ජල තුළ මහ ළිං 02 ක්, ජල කුළුණු හා පොම්පාගාර ආදිය 2015 දෙසැම්බර් 31 දක්වා නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

**3.4 ව්‍යාපෘති කටයුතු අවසන් කිරිම**

**--------------------------------**

2015 ජුලි 23 දිනට ණය නියෝජිතායතනයේ මූල්‍යයන වැඩ පිළිවෙල අවසන් කර තිබුණද, වසා දැමීමේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.